

# හිම බිමේ සුදු රෝස

## විද්‍යානි මනතුංග ලියන නවකතාව

මගේ හදවත මොහොතකට අක්‍රිය වූවා සේ මට හැඟුනි. මම මේ තරමට ම ජීවිතයේ පව්කර තිබේ ද? මගේ සිතට සතුටක් ඇතුළු කරවන සෑම සිදුවීමක් ම අවසන් වන්නේ දරුණු ලෙස මා වේදනාවට පත්කර ලමිනි. කිසිවෙකුට වරදක් නොකරන්නට, කිසිවෙකුගේ සතුටට සැපතට බාධා නොකරන්නට මම හැම විටක ම කැපවීමෙන් ක්‍රියා කෙරුවෙමි. එහෙත් මගේ සතුටත් සැපතත් වෙනුවෙන් වූ මාර්ගය හැමවිටක ම පවතින්නේ බාධා දුක් කරදර ගොන්නක් මැද ය. ඒ සතුට මගෙන් මිදී මා අතහැර යනවා මැදහත් සිතින් ඉවසා ගැනීමට හැකි ආත්ම ශක්තියක් මනුශ්‍යත්වයේ නාමයෙන් මා තුළ වෙතැයි මම විශ්වාස කරමි. නමුත් ගස් මුදුනේ පිපී තිබෙන මල් පොකුර අත්ත බිඳී යා නොදී ප්‍රවේශමෙන් නෙලා ගැනීමට සිතා අත්ත පහත් කරගන්නා සෑම මොහොතක ම, මගේ ඇඟිලි තුඩු ගෑවෙන තරමේ දුරක දී නැවත මගේ ශක්තියෙන් මිදී එය ඈතකට යාම මට දරා සිටිය නොහැක.

මට මේ දැනෙන, හැඟෙන සියල්ලම පැහැදිලි කරගත යුතුය. අවසාන ඉරණම කුමක් වෙතත් සියල්ල නිසැකයෙන්ම දැනගැනීමට මේ අවස්ථාව විය යුතුය.

"ටාන්‍යා... මට තේරුම් ගන්න අමාරුයි ඔයා කියන දේ...."

"ලහිරු... අපි එකට ඉගෙන ගන්න කාලයෙත් මේ ගැන දවසක මම ඔයත් එක්ක කතා කළා... පස්සෙ කාලෙක මහේල නිසා ඒ බලාපොරොත්තුව මගෙන් ඈත් වුණා..."

"ඔයා මොකක් ගැන ද මේ කියන්නෙ ටාන්‍යා...?"

"මම යන්න කලින් ඔයාට මේ ගැන කියන්න ඕනැ ලහිරු... ඒ හැමදෙයක් ම දැනගන්න ඔයාට අයිතියක් තියෙනව..."

"මොකක්ද ටාන්‍ය ඔයා මේ කියන දේ...? මට තේරුම් ගන්න පුළුවන් විදිහට කියන්නකො..." මගේ හඬේ මිශ්‍ර වී තිබූ අමනාපය ඈ තේරුම් ගන්නට ඇත. ඒ නිසා ම ඇය සිනාසෙන්නට විය.

"ඔයා කාලයක් මම කියන හැම දේකට ම තරහ ගත්ත. ඊට පස්සෙ මම කියන හැමදේකට ම නිහඬ වුණා. දැන්......."

"ඔව් දැන්... දැන් මොකද මම...?" ටාන්‍යා මොහොතක් මා දෙස නිහඬ ව බලා සිටියේ ය. ඒ බැල්මේ දයාබරත්වය මුසුවී තිබෙනවා මම දුටුවෙමි.

"දැනුත්... කවදත් ඔයා එක විදිහයි ලහිරු... ඔයා තුළ මම දකින විශේෂත්වයත් ඒකමයි..."

"ඔයා වැරැදියි ටාන්‍යා... මගේ අතීතයත් එක්ක බලනකොට මම දැන් හුඟක් වෙනස් වෙච්ච කෙනෙක්..."

"මිනිස්සුන්ගෙ වයසෙ..., මුහුකුරා ගිය අදහසවල..., බාහිරව පේන්න තියන පෙනුමෙ... ඇතිවන වෙනස්කම් නිසා මිනිස්සු වෙනසවෙලා කියන්න අමාරුයි ලහිරු.... ඒ මිනිසසුන්ගෙ හදවතත්, ඒකෙ පිරවිල තියන හොඳ ගතිගුණත් වෙනස් නොවී තියන තාක්කල්... "

"මාව ඔය තරම් ඉහළින් තක්සේරු කරන්න එපා ටාන්‍යා.. මට වඩා හොඳ ගතිගුණ වලින් පිරුණු ලස්සන හදවත් මම ඕනතරම් දැකල තියනවා..."

"එහෙම නම් ඔයා හරි වාසනාවන්තයි... මම ඒ වගේ ලස්සන හදවත් දැකල තියෙන්නෙ කිහිපයක් විතරයි... ඒ වගේ ලස්සනක් මගේ හදවතේ ඇති කරගන්න මම තවමත් උත්සාහ කරමිනුයි ඉන්නෙ ලහිරු..."

"ඔයා නොදන්නව වුණාට ඔයා ළඟ තියෙන්නෙත් ලස්සන හදවතක් ටාන්‍යා..."

"ඒ ලස්සන ටිකක් හරි දැකගන්න මට ඇත්තට ම පුළුවන් ද බලන්නයි මම හෙට ලංකාවට පිටත් වෙලා යන්නෙ ලහිරු..."

"මොනව ඔයා ලංකාවට යනව... මොනවට ද...? කොහේට ද...?"

"ඔව් ලහිරු. මේක මම කාලයක් තිස්සෙ හිතන් හිටිය දෙයක්... ගුරුවරියක් හැටියට රැකියාවක් වෙනුවෙනුයි මම යන්නෙ."

"ලංකාවට ම යන්න හිතන් හිටිය ද ඔයා...?"

"නෑ ලංකාවට ම කියල හිතන් හිටියෙ නැහැ... තාත්ත නිසා කොහේ හරි ආසියානු රටකට යන්න ආසාවක් මගෙ තිබුණා. ඔයා නිසා තමයි ලහිරු ලංකාවට ම යන්න ඕනැ කියල ආසාවක් මට ඇතිවුණේ ..."

"මම නිසා..."

"ඔව් ඔයා විශේෂයි. ඔයාගෙ අම්ම තාත්තත් ඊට මුල් වුණා..."

"මගෙ අම්ම තාත්ත..." මම තවත් පුදුම වුණෙමි.

"ඔව් ලහිරු මට යන්න ඕනෙ පළාත ගැන අදහසක්, ඇති කරගන්න ඔයාගෙ අම්ම මට හුඟක් උදව් කළා..."

"අම්ම මට මේ කිසිදෙයක් කිව්වෙ නැහැනෙ..."

"කියන්න තරම් දෙයක් අම්ම දැනගෙන හිටියෙත් නැහැ ලහිරු..."

"ඇයි ටාන්‍යා, ඔයා මට මේ කිසිදෙයක් කල් ඇතුව නොකිව්වෙ...?"

"එහෙම නොකිව්වෙ තේරුමක් ඇතිව ලහිරු..."

"මොකද්ද තේරුම...?"

"මගේ තීරණ නිසා ඔයාගෙ අනාගතය වෙනුවෙන් ඔයා ගන්න තීරණවලට බලපෑමක් ඇතිවෙනව දකින්න මම කැමැති නැහැ ලහිරු..."

මට වටහාගත නොහැකි යමක් ගැන ඇය කතා කරනවා යැයි මට සිතුනි. එහෙත් මට මා ගැන ම දුකක් ඇතිවිය.

"ඔයා කැමැති විදිහට ඔයාගෙ ජීවිතේ පිළියෙළ කරගන්න එකට මගේ කිසිම බලපෑමක් නැහැ ටාන්‍යා... ඒක ඔයාගෙ සතුට නම් මුළු හදවතින් ම මම ඔයා සුභ පතනව..."

"ස්තුතියි ලහිරු... දවසක මේ විදිහට ම ඔයා වෙනුවෙනුත් සතුටු වෙන්න මට අවස්ථාවක් ලැබෙයි කියල මම බලාපොරොත්තු වෙනව..."

මම සිනාසුනෙමි. එය මා වෙනුවෙන් මා තුළ ම නැගුනු සමච්චල් සිනහවකි.

"මගේ අනාගතයත්..., ඒකෙ ඉරණමත්... ඔය කොහේ හරි තැනක ලියවිල ඇති ටාන්‍ය...... ඒක දැනගෙන දවසක ඔයාට සතුටු වෙන්න පුළුවන් වුණොත් එහෙම වෙන්න. ඒත් මම ඒ වෙනුවෙන් ගන්න තීරණය මොකක් ද කියල නම් ඔයාට දැනගෙන ම යන්න පුළුවන්..."

"ඔයාගෙ තීරණය දැනගෙන ම යන්න පුළුවන්...?"

"ඔව් ටාන්‍යා... මගේ අනාගතය වෙනුවෙන් හිතල මම ගන්න තීරණය මේ වෙනකොටත් මම අරගෙනයි තියෙන්නෙ..."

"ඒ කිව්වෙ ලහිරු..."

"මගේ ජීවිතේ ඉතුර කාලෙ මේ පර්ත් වලම ගතවෙලා යයි ටාන්‍යා..."

"එතකොට ඔයාගෙ රැකියාව...?"

"දැනටමත් ඒක නැතිවෙලයි තියෙන්නෙ..."

ඈ හඬන්නට ගති. ඇගේ කම්මුල් දිගේ බේරී පහතට ගලා යන කඳුළු වැල් මා තවතවත් වේදනාවට පත්කලේය.

"ටාන්‍යා.. ඔයා බලාපොරොත්තු වුණ ඔයාගෙ සතුට වෙනුවෙන් ඔයා හිනාවෙන්න ඕනැ වෙලාවක් මේක..."

කඳුළු පිසදාගත් ඈ නැවත කතාව ඇරැඹීවාය.

"ලහිරු... මගේ ජීවිතයෙ මම ලබපු ලොකුම වාසනාව මොකක් ද දන්නව ද?"

"මොකක් ද ටාන්‍යා?"

"ඔයාව මුණගැහුන එකයි... ලහිරු......"

"ඉදිරියේ දීත් හිතවතෙක් හැටියට ඔයා වෙනුවෙන් මට කරන්න පුළුවන් හැම උදව්වක් ම මම කරනව ටාන්‍යා..."

"ඒ ගැන මට සැකයක් නැහැ ලහිරු..."

අප අතර පැතිර ගියේ නිහැඬියාවකි. පිටුපසින් ඇසෙන රළ බිඳෙන හඬ ඒ නිහැඬියාවට අත්වැලක් විය. මට උවමනා වූයේ දිගටම එසේ නිසසලව සිටීමට ය. එහෙත් ඈ නැවත කතාව ඇරැඹුවා ය.

"මහේලත් මාත් අතර තිබුණ සම්බන්ධයේ හැබෑ තත්වය දැනගන්න ඔයාට උවමනාවක් නැත් ද ලහිරු..?"

"විශේෂත්වයක් මට නැහැ ඒ ගැන ටාන්‍යා... ඔයා කියන්න කැමැති දෙයක් තියනව නම් කියන්න..."

"වෙන කෙනෙකුට නෙමෙයි... ඔයාට ඒ ගැන කියන්න මම කැමැතියි ලහිරු..."

"හ්ම්..."

"මුලින් ම මුණගැහුනු දවසෙ ඉඳල ම ඔයා තුළ වෙන කවුරුත් කෙරෙහි දැකල නොතිබුණු විශේෂත්වයක් මම දැක්ක ලහිරු... ඒක මට විස්තර කරන්න බැරි දෙයක්... හරියට මීට කලින් කොහේදි හරි අපි මුණගැහිල තියනව වගේ හැඟීමක්...... මම මහේලව හඳුන ගත්තෙත් ඔයත් එක්ක හිටිය ඔයාගෙ යාළුවෙක් හැටියට විතරයි..."

"එතකොට මහේලට ආදරය කරන්න ගත්තෙත් මගෙ යාළුවෙක් හැටියට හිතල ද.....?" මා තුළ නැගී ආ කෝපය මැඩ ගනිමින් මම ප්‍රශ්න කළෙමි.

"පොඩ්ඩක් ඉවසල ඉන්න මම කියනකම්... ඔයාගෙ ඇසුර මම ප්‍රිය කළ එක කරුණක් තමයි ඕක..."

"මොකක් ද?"

"ඔයාගෙ අවංකකම.... ඔයාගෙ හැම වචනයක් ම ඔයාගෙ හදවතින් අවංකව ම මතු වෙලා ආව ඒවයි ලහිරු..."

"ටාන්‍යා මා ගැන ඔයා කතා කරල තියන තරම මේ හොඳට ම ඇති තේරුණා ද... ? මට චරිත සහතිකයක් අවශ්‍ය වුණොත් දවසක මම ඒ ගැන ඔයාට කියන්නම්... වෙන දෙයක් ගැන කතා කරන්න තියනව නම් විතරක් කතා කරන්න. නැත්නම් අපි යමු..."

"පොඩ්ඩක් ඉන්න..."

නැගී සිටීමට තැත් කරමින් සිටි මා වැලමිට ළඟින් අල්ලා ඈ නැවත්වූවේ සිනාසෙමිනි. ඒ අත අත් නොහැර ම ඈ කතාව දිගට ම ගෙන ගියා ය.

"ලහිරු... ඔයා අකමැති වුණත් වෙන කිසි කෙනෙකුට කියල නැති මේ කතාව ඔයාට කියන්න ඕනැ මම..."

"ඉතින් කියන්න..."

"ඔය දෙන්නව ම මම ඇසුරු කළාට හිතවත්කමින්... ආදරයක් පිළිබඳව මම කවදාවත් හිතල තිබුණෙ නම් නැහැ..."

"ඉතින්..." මට මේ වැල්වටාරම් දැනගැනීමෙන් ඇතිවන ඵලක් නොමැත.

"තරහ නොගෙන ඉන්න ලහිරු... ඔයා අන්තිම අවුරුද්දෙ විභාගයෙන් පස්සෙ දෙසැම්බර්වල ලංකාවට ගියහම පුදුම පාලුවක් තනිකමක් මගෙ ජීවිතේට ඇතුළු වුණා. ලංකාවෙ ඔයා ඉන්න තැනක් ගැන කිසිම අවබෝධයක් මගෙ තිබුණෙ නැහැ... ඔයාව අඳුරනවයි කියල හිතපු හැම කෙනෙකුට ම මම කතා කළා..."

"ඔයා මා ගැන විස්තර කෙලින් ම ඇහුව ද ඒ අයගෙන්...?"

"ඒ ඒ අයගෙ හැටියටයි මම කතා කළේ ලහිරු... හැමෝගෙන් ම මට කෙලින් ම අහන්න බැහැනෙ..."

"මහේලගෙනුත්...?"

"ඔව්. ඒත් එයාවත් කිසිදෙයක් මට කියන්න දැනගෙන හිටියෙ නැහැ..."

"හ්ම්..."

මා ඊට වඩා ඒ ගැන ප්‍රශ්න කිරීමට නොගියෙමි. දැන් සියල්ල සිදුවී අවසානය. මහේල ක්‍රියාකර ඇත්තේ ඔහුගේ සිතැඟි මුදුන්පත් කරගැනීමට ය. මගේ තොරතුරු ටාන්‍යාට හෙළි නොකිරීම ඔහුගේ වරදක් නොව මගේ වරදකි.

"ඒ අතරතුර මහේල මගේ ජීවිතයට පුදුම විදිහට ලං වුණා... මම කවදාවත් දැකල

### මෙතෙක් කතාව

උසස් අධ්‍යාපනය සඳහා පර්ත් පැමිණෙන ලහිරුට එහිදී ටාන්‍යා මුණගැසේ. ඕස්ට්‍රේලියානු සංස්කෘතිය තුල හැදී වැඩී තිබුනද ටාන්‍යා වෙතින් දිස්වෙන නිහතමානී අහිංසක ගති පැවතුම් වෙතට සිත ඇදී යන ලහිරු, ඇයට සිතින් ආදරය කරයි. නමුත් ටාන්‍යා තමා අසලක වෙත්දී අකාරුණික ලෙස නිරතුරුවම ඇය ප්‍රතික්ෂේප කල ලහිරු උපාධි ප්‍රධානෝත්සවය දා රාත්‍රියේ, එදා ඒ අසංවේදී අතීතය මත තමා සිත්තම් වීමට ඉඩහැරියේ ප්‍රමාදයක අම්හිරි වූ සත්‍යය බව වේදනාකාරී ලෙස හෙලිදරව් කරගනී. ටාන්‍යාගේ ආදරය තමාගේම මිතුරෙකු වන මහේලට හිමිවීමත් සමඟ මව්බිම කරා යන ලහිරු, සොඳුරු ආදරයක මතක සටහන් සමඟ හුදකලා දිවියකට මුලපුරයි. තවත් වසර කිහිපයකට පසු මහේල වෙනත් කෙනෙකු සමඟ හදිසියේම විවාහවීම නිසා නොසන්සුන් වන ඔහු නැවත වරක් පර්ත් පැමිනෙන්නේ ටාන්‍යා වෙනුවෙන් වූ ප්‍රාර්ථනා ගොන්නක් පොදි බැඳගෙනය. එහිදී ලහිරු අනතුරකට මුහුණපෑවද ඒ හේතුවෙන්ම ටාන්‍යා නැවත මුණගැසීමේ අවස්ථාව ඔහු හිමිකරගනී.

**අද එතැන් සිට....**